# අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා 2016 ඔක්තෝබර 27 වන දා

# පාර්ලිමේන්තුව අමතමින් ඉදිරිපත් කළ ආර්ථික ඉදිරි දැක්ම

ගරු කතානායකතුමනි,

රටේ ආර්ථිකයේ වත්මන් තත්ත්වය, අපේ ආර්ථිකයේ ඉදිරි ගමන සහ අපේ අනාගත අභිලාෂයන් පිළිබඳ 2015 නොවැම්බර් 05 වැනි දා මේ ගරු සභාව ඉදිරියේ කරුණු දක්වමින් කියූ දෙයක් අද යළිත් ඔබ ඉදිරියේ සිහිපත් කරන්නට කැමතියි.

"මානවම්ම සිට මහා පරාක්‍රමබාහු දක්වා වූ අපේ රටේ ස්වර්ණමය යුගය යළි අප උදාකරගත යුතුව තියෙනවා. ඒ සඳහා කැපවීම, වගවීම හා ඉවසීම ඇතිව නිවැරදි මාවතේ ඉදිරියට යා යුතුයි. අපේ මාතෘ භූමිය නිසි තැනට ඔසවා තබන්නටත්, අපේ අනාගත පරම්පරාවට යහපත් දේශයක් නිර්මාණය කර දෙන්නටත් අපට හැකි වන්නේ එවිටයි."

එය අවධාරණය කරමින් මා කියා සිටියේ අපේ ආර්ථිකයේ ඉදිරි ගමන සඳහා විප්ලවීය චින්තනයක් අවශ්‍ය බවයි. එසේම අභීත ප්‍රතිපත්ති සහ පියවර ගත යුතු බවයි.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ නායකත්වයෙන් යුතු ජාතික රජය සිය ආර්ථික කටයුතු ආරම්භ කළේ සියලු රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරමින්. සහන ගණනාවක් ලබා දෙමින්. මෙය අපේ ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යෑමේ සවිමත් පදනමක් වුණා. මෙමගින් දේශීය ඉල්ලුම වැඩි කිරීමටත්, පසුගිය පාලනයෙන් අපට දායද වූ බරපතළ ආදායම් විෂමතා හැකි තාක් සමනය කිරීමටත් අපට හැකි වුණා.

එසේ නමුත් තවත් බොහෝ දේ කළ යුතු යුතුව තිබෙනවා. අපේ ඉලක්කය ජනතාවගේ ආදායම් මට්ටම් වඩාත් ඉක්මනින් ඉහළ නැංවීමයි. පසුගිය අවුරුදු 60 ක කාලය තුළ ආදායම් වර්ධනය සලකා බලද්දී බොහෝ අග්නිදිග ආසියාතික රටවලට වඩා අප ඉන්නේ පිටුපසින්. එසේම අපේ අසල්වැසි දකුණු ආසියාතික රටවල ආදායම් මට්ටම් සමග අප ළං වී සිටින්නේ යන්තමින්. දැනට ඒක පුද්ගල දළ ජාතික ආදායම වන ඇමෙරිකානු ඩොලර් 4000, අපි ඇමෙරිකානු ඩොලර් 8000 දක්වා වැඩි කර ගත යුතුයි. දැනට අපේ ආර්ථිකය වර්ධනය වන්නේ වර්ෂයකට 5% වේගයෙන්. මේ වේගයෙන් ගියොත් ඒක පුද්ගල ආදායම දෙගුණ වන්නට 2033 දක්වා බලා සිටින්නට අපට සිදු වෙනවා.

අපිට වසරකට 7% ක ආර්ථික වර්ධනයක් පවත්වා ගත හැකි නම් ඒක පුද්ගල ආදායම වර්ෂ 2025 වන විට දෙගුණ කර ගත හැකියි. මේ 7% ආර්ථික වර්ධන වේගය අපේ රට අවසන් වරට ලබාගත්තේ යුද්ධය අවසන් වුණු විගස 2009 දී යි. අවාසනාවකට සාමයත් සමග ලැබිය යුතුව තිබුණු ආර්ථික ප්‍රතිලාභ ලබාගන්නට අපේ රටට නොහැකි වුණා.

2012 න් පසු වර්ධන වේගය 5% ට වඩා පහත වැටුණා. පෞද්ගලික ව්‍යවසායන් සමහරක් රජයට පවරා ගැනීමත් සමග දේශීය සහ විදේශීය ආයෝජකයන් බියට පත් වුණා. සුදු අලියන් බවට පත්වූ රාජ්‍ය ව්‍යාපෘතිවලට රජය විසින් මහත් සේ ණයට මුදල් ගැනීම නිසා පෞද්ගලික ආයෝජකයන්ට ණය ලබා ගැනීමට බැංකු වල අතිරික්ත මුදල් තිබුණේ නැහැ.

නමුත් 2015 වසර තුළ ආදායම් බෙදීයාමේ විෂමතා හැකිතාක් අඩු කරන්නට අප උත්සාහ කර තිබෙනවා. අඩු ආදායම් ලාභීන්ගේත්, රාජ්‍ය සේවකයන්ගේත් ආදායම් වැඩි කළා. ඇති හැකි අයගෙන් බදු මුදල් අය කර ගෙන රටේ සංවර්ධනයට යොදා ගත්තා. රජයේ ණය ගැනීම් අඩු කළා.

දැන් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව මෙන්ම යුරෝපයේ, ජපානයේ සහ අමෙරිකා එක්සත් ජනපදයේ අනෙකුත් ණය දෙන ආයතන සහන පොලී අනුපාතිකයන් මත අප රජයට ණය මුදල් ලබා දීමට යළිත් ඉදිරිපත් වෙමින් සිටිනවා. ඒ මගින් අපේ ආර්ථිකය පුළුල් හා ශක්තිමත් කරලීමට හැකි වෙනවා. මේ ආකාරයට ජාත්‍යන්තර මූල්‍ය අනුග්‍රහය අවසන් වරට ලැබුණේ මා අග්‍රාමාත්‍යව සිටි 2001 – 2004 වකවානුවේදීයි. දැන් නැවතත් ජනාධිපති සිරිසේන මැතිතුමාටත්, මටත් නැවතත් විදේශීය මූල්‍යාධාර වැඩි වැඩියෙන් ලබා ගන්නට හැකි වී තිබෙනවා.

ශත වර්ෂ ගණනාවක් තිස්සේ ඉන්දීය සාගරයේ හදවත වූයේ ශ්‍රී ලංකාවයි. බටහිර සහ නැගෙනහිර ආසියාව යා කරන කේන්ද්‍රීය මර්මස්ථානය වූයේ ද ශ්‍රී ලංකාවයි. ගෝලීය වෙළෙඳ සම්බන්ධීකරණ සහ මෙහෙයුම් සමබන්ධයෙන් කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික වැදගත් පිහිටීම සැවොම පිළිගන්නවා.

මේ පසුම්බ ඔස්සේ වඩාත් තිරසාර ආර්ථික ක්‍රමවේදයක් රටේ ස්ථාපිත කරන්නට අප පදනම සකස් කරමින් සිටිනවා. දුර්වල ආර්ථික ව්‍යුහයක පව් බර කර ගැසීමට පසුගිය වසර පුරා අපට සිදු වුණා. එය අතීතයේ අනුගමනය කළ පටු ආර්ථික ප්‍රතිපත්තිවල අහිතකර ප්‍රතිපලයයි. අමෙරිකානු ඩොලර් බිලියන 11 ක් පමණ වූ අපනයන ආදායම පහත වැටෙමින් පවතිනවා. නිමි ඇඟළුම් අපනයනය අමෙරිකානු ඩොලර් බිලියන 5 ක මට්ටමක හිර වෙලා. ජීඑස්පී ප්ලස් සහනය යළි ලබා ගැනීම සඳහා අප අයදුම් පතක් ඉදිරිපත් කළේ ඒ ඔස්සේ නැවතත් ඇඟළුම් කර්මාන්තයේ පිබිදීමක් ඇති කරලීම සඳහායි.

ලෝක වෙළෙඳපොළේ තේ හා රබර් මිල පහත වැටීමත් සමග අපේ කෘෂි නිෂ්පාදන අපනයන ආදායමත් අඩු වෙලා. වැවිලි ක්ෂේත්‍රයේ සමහර සමාගම් හොඳින් කටයුතු කළත් සමහර සමාගම් දුර්වලයි. ඒ නිසා නව ප්‍රාග්ධනය මෙන්ම කාර්යක්ෂමතා මට්ටම් ද හඳුන්වාදෙමින්, අවශ්‍ය නම් නව සමාගම්ද ඇතුළත්ව, ප්‍රාදේශීය වැවිලි සමාගම් ප්‍රතිව්‍යුහගත කොට කාර්යක්ෂම ව්‍යවසාය බවට පරිවර්තනය කිරීමට අප කටයුතු කරනවා.

ගෙවී ගිය 30 වසරක පමණ කාලය තුළ අපේ අපනයන නිෂ්පාදනවල සංයුතිය තරගකාරී වෙළඳපොලට සරිලන අයුරින් වෙනස් වී නැහැ. තවමත් අපි අපනයන ආදායමෙන් බහුතරයක් උපයා ගන්නේ නිමි ඇඟළුම්, තේ, රබර්, මැණික් සහ සංචාරක කර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි පටු අපනයන පදනමක් මතයි. මෙබඳු පටු සීමාවන් තුළ දීර්ඝ හා තිරසාර ආර්ථික වර්ධනයක් ලබා ගැනීම අසීරුයි.

මැදපෙරදිග අපේ ශ්‍රමිකයන් දැඩි වෙහෙස මහන්සියෙන් උපයන ආදායම් පිළිබඳව ද අවිනිශ්චිත භාවයක් පැන නැගී තිබෙනවා. දැන් කලක් තිස්සේ ලෝක වෙළෙඳපොලේ තෙල් මිල අඩු වී තිබීම නිසා සෞදි ආරාබිය වැනි රටවලට තමන්ගේ රට වැසියන්ට පවා ගෙවන වැටුප් අඩු කිරීමට සිදුව තියෙනවා. මෙය මැදපෙරදිග සේවය කරන ලාංකේය ශ්‍රමිකයන්ට අලුතෙන් එල්ලවන අභියෝගයක්.

ගෝලීය ආර්ථිකය කඩා නොවැටී පවත්වාගෙන යාම සඳහා අරගලයක යෙදෙන පසුබිමක, දේශීය ආර්ථිකයේ සැලකිය යුතු වර්ධනයක් පවත්වාගෙන යාමටත්, ආර්ථික ගතිකයන්ගේ වෙනස් වීම් මධ්‍යයේ සාර්ථකව ඉදිරියට යෑමටත් ශ්‍රී ලංකාව සමත් වී තියෙනවා.

මෙහිදී මෙරට සහ පිටරට වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට ඉදිකිරීම් කර්මාන්තයේ ආයෝජන කරන මෙන් අප දිරිමත්කළා. මේ නිසා ඉදි කිරීම් ක්ෂේත්‍රයේ පිබිදීමක් ඇති වුණා.

ලෝකයේ අපේ රට ගැන තිබෙන ප්‍රතිරූපය දියුණු වීමත් සමඟ සංචාරකයන්ගේ පැමිණීම සැලකිය යුතු අන්දමින් ඉහළ ගොස් තිබෙනවා. දශකයක් පුරා අපේ වෙළෙඳපොළ ගැන නොතකා සිටි ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර ගුවන් සේවා සහ හෝටල් සමාගම් නැවතත් මෙරටට පිවිසෙන්නට පටන් අරන් තිබෙනවා.

සාර්ථකත්වය සඳහා ඉහළ වර්ධන වේගයක් අප පවත්වාගෙන යා යුතුයි. එමගින් අපනයන මෙන්ම දේශීය ඉල්ලුම ද ඉහළ නංවාගත හැකියි. වේගවත් සංවර්ධනය හේතුවෙන් රජයේ ආදායම ද ඉහළ යනවා. මා පසුගිය වසරේ ද සඳහන් කළ පරිදි, රජයේ ආදායම් පහත වැටීම හා වාණිජ ණය උපරිම මට්ටම දක්වා ඉහළ නැංවීම නිසා ආර්ථික වර්ධනයට බාධා සිදු වෙනවා.

අපනයන ක්ෂේත්‍රයේ ඉහළ වර්ධනයක් සඳහා විශාල ප්‍රාග්ධන සැපයුම් සහ මහා පරිමාණ ආයෝජන අවශ්‍ය වනවා. වඩාත් වර්ධනීය ප්‍රතිපල ලබා ගැනීමට නම් නව තාක්ෂණ සොයා ගැනීම්, නවීන කළමනාකරණ දත්ත ක්‍රමවේදයන් හා යාවත්කාලීනක වෙළෙඳපොළ තොරතුරු ආදියෙන් සන්නද්ධ විය යුතු වෙනවා.

එක් දහස් නවසිය අසූ ගණන් වලදී තම නිෂ්පාදන කර්මාන්ත සේවාවන් බැහැරින් ලබා ගැනීම වඩාත් සුදුසු බව ජපානය කල්පනා කළා. ඔවුන් තීරණය කළේ මෙහෙයුම් කටයුතු තායිලන්තය හා ශ්‍රී ලංකාව වෙත ගෙන යන්නයි. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන වාර්තාවක් සැකසීම පිණිස ජපන් දූත පිරිසක් 1983 දී මෙහි පැමිණියා. ඔවුන් මෙරටට ගොඩබැස්සේ 83 කලු ජූලිය ඇරඹෙනවාත් සමගමයි. මේ නිසා අපේ අවස්ථාව අහිමි වුණා. තායිලන්තයට අමෙරිකානු ඩොලර් බිලියන 50 ක ජපන් ආයෝජන ලැබුණා. තායිලන්තයේ තවත් ආයෝජන සිදු කළ නොහැකි බැවින්, අමෙරිකානු ඩොලර් බිලියන 13 ක ජපන් ආයෝජන මැලේසියාවට යොමු කෙරුණා.

මා කර්මාන්ත ඇමැතිවරයා ලෙස පත් වූ පසු කාර්මීකරණ ප්‍රවර්ධනය සඳහා සැලකිල්ල යොමු කළා. ඒ වන විට වියට්නාමය වෙළෙඳපොළ ආර්ථික ක්‍රමවේදයට පිවිසුණා පමණයි. උපදෙස් සඳහා ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණියා. එහෙත් අවාසනාවකට යුද්ධය පැතිර යෑම නිසා 1997 වන විට කාර්මීකරණ වැඩපිළිවෙළ අත්හැර දමන්නට අපට සිදු වුණත් වියට්නාමය කාර්මීකරණය ඔස්සේ ඉදිරියටම ගෙන ගියා.

1990 දී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායම අමෙරිකානු ඩොලර් බිලියන 1.9 ක් වෙද්දී වියට්නාමයේ අපනයන ආදායම අමෙරිකානු ඩොලර් බිලියන 2.4 යි. විසිපස් වසරකට පසු අද තත්වය කුමක්ද? ශ්‍රී ලංකාවේ අපනයන ආදායම අමෙරිකානු ඩොලර් බිලියන 10 යි. වියට්නාමයේ අපනයන ආදායම අමෙරිකානු ඩොලර් බිලියන 162 යි. මේ ආදායමෙන් බහුතරයක් ඔවුන් ලබා ගත්තේ නිෂ්පාදන කර්මාන්ත වලිනුයි.

2003 දී මා අග්‍රාමාත්‍ය ධූරය දරන අවදියේ යුරෝපා හවුලේ ජීඑස්පී ප්ලස් තීරු බදු සහනය සඳහා අයදුම් කළා. එම අයදුම් පත පිළිබඳ සාකච්ඡා නිම කළේ චන්ද්‍රිකා කුමාරතුංග

ජනාධිපතිනිය විසින්. ඒ අතර බංග්ලාදේශයත් යුරෝපීය වෙළඳ පොළේ ජීඑස්පී සහනය භුක්ති විඳීමේ අවස්ථාව ලබා ගත්තා. 2010 වසරේදී ශ්‍රී ලංකාවට හිමිව තිබූ ජීඑස්පී ප්ලස් සහනය අහිමි වුණා.

2003 දී අපේ රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තය අමෙරිකානු ඩොලර් බිලියන 2.5 ක් පමණ වූවා. ඒ වසරේ බංග්ලාදේශයේ රෙදිපිළි සහ ඇඟළුම් ආදායම අමෙරිකානු ඩොලර් බිලියන 5.2 යි. 2015 වන විට අපි රෙදිපිළි සහ ඇඟළුම් අපනයන කර්මාන්තයෙන් අමෙරිකානු ඩොලර් බිලියන 4.8 ක් උපයද්දී බංග්ලාදේශය අමෙරිකානු ඩොලර් බිලියන 26.6 ක් උපයනවා.

දුප්පත්කමින් හා පසුගාමීත්වයෙන් මිදී ඉදිරියට යන සංවර්ධිත රටක් බවට පත් වන්නට නම් අපේ වර්ධනය වේගවත් කරලීමට පාදක වන මහා පරිමාණයේ ඍජු විදේශ ආයෝජන මෙරටට ඇද ගත යුතුයි. අප සියළු දෙනා අවබෝධ කර ගත යුතු සත්‍යය එයයි.

රැකියා උත්පාදනයට දායක වන ආයෝජන දිරිමත් කරලීමේ පරිසරයක් අප සකස් කරන්නේ ඒ නිසයි. ව්‍යාපාර ඇරැඹීමට හරස් වන නොයෙකුත් රෙගුලාසි සහ බාධක සියල්ල ඉවත් කරන්නේ ඒ නිසයි. ඉදිකිරීම සඳහා අවසර ලබා ගැනීම, විදුලි සබඳතා සහ බැංකු ණය, දේපොළ ලියාපදිංචිය, සුළුතර ආයෝජකයන්ගේ සුරක්ෂිතතාව, ආදායම් බදු ගෙවීම, විදේශ වෙළෙඳාම, ගිවිසුම් ක්‍රියාත්මක කිරීම, බංකොළොත් ව්‍යාපාර සමථයකට පත් කිරීම, රැකියා වෙළඳපොල රෙගුලාසි ආදී ක්ෂේත්‍ර ගණනාවක් සඳහා ඇති අවහිරතා අප ඉවත් කරනවා. මෙයට අමතරව ආයෝජන සඳහා අවශ්‍ය සියළු අනුමැතීන් එක් කවුන්ටරයකින් ලබා ගත හැකි පරිදි නව නීති සම්පාදනය කරනවා. රටක ව්‍යාපාර කිරීමේ පහසුව සංසන්දනාත්මකව ඇගයීමට ලක් කරන ලෝක බැංකුවේ දර්ශකයක් තිබෙනවා. **ඊධඪදඨ ඕහඑඪදඥඑඑ ඞදඤඥය** නමින් හැඳින්වෙන මේ දර්ශකයේ ඉහළින්ම තිබෙන රටවල් 70 අතරට ශ්‍රී ලංකාව ද 2020 වන විට පත් කිරීම අපේ ඉලක්කයයි.

මේ ශක්තිමත් පදනම මත ඉන්දීය සාගරයේ සංවිධාන සහ ව්‍යාපාර ශක්තිය සතු කේන්ද්‍රස්ථානය බවට පත් වීමේ සැලසුමට අප මුල පුරා තියෙනවා. ඒ අරමුණ පෙරදැරි කර ගනිමින්, කලාපයේ විවිධ රටවල් සමග පහසුවෙන් සම්බන්ධ වීම සඳහා ජාත්‍යන්තර ගුවන් තොටුපොල සහ වරාය තුනක සංවර්ධන කාර්යයන් අප ආරම්භ කර තියෙනවා.

ප්‍රාග්ධන දීමනා සහ අඩු බදු ක්‍රමවේදයක් පදනම් කර ගත් ආයොජන දිරිගැන්වීම් හඳුන්වා දෙනවා. මේ පිළිබඳ වැඩි විස්තර අයවැය යෝජනා වලදී ඉදිරිපත් කරනවා.

එසේම ආනයන හා අපනයන පාලන පනත වෙනුවට නව පනතක් හඳුන්වා දෙනවා. එය සිංගප්පූරුවේ ආනයන හා අපනයන රෙගුලාසි පනතට සහ උපායමාර්ගික භාණ්ඩ පාලන පනතට සම කළ හැකියි.

අපේ දේශීය ව්‍යවසායකයින්ට ද මෙහිදී විශාල කාර්ය භාරයක් තිබෙනවා. ඔවුන්ට තරගකාරීත්වය වැඩි දියුණු කොට අපනයන නිෂ්පාදනය ඉහළ නැංවිය හැකියි. මේ සමගම නව රැකියා අවස්ථාවන් ද බිහි වෙනවා. මෙතැන දී දේශීය ව්‍යවසායකයින් දිරිමත් කරමින්, ඔවුන්ට ගෝලීය තරගකාරීත්වයට එක්වීමට අවශ්‍ය සහය ලබා දීමට අපි වෙළඳ ගැලපුම් පැකේජයක් - **ඊපචඤදඥ ඒඤදණහඑබඨඥදබ ඕචජඬචඨඥ** – හඳුන්වා දෙනවා. අලුත් යන්ත්‍රෝපකරණ ලබා ගැනීම සඳහා ලබා දෙන ප්‍රාග්ධන දීමනාවන් ද ඊට ඇතුළත්.

මේ ආකාරයෙන් දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන් දිරිමත් කරන්නේ අප මුහුණ දී ඇති ප්‍රධාන අභියෝග දෙකක්, එනම් පෞද්ගලික අංශය කරන අඩු ආයෝජනය සහ රජය මුහුණ දී සිටින විශාල ණය ප්‍රමාණය යන අභියෝග ජය ගැනීම සඳහායි.

ඔබ හොඳින් දන්නා පරිදි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, මාත් ගෙවී ගිය වසර පුරා කිහිප අවස්ථාවක විදේශයන්හි සංචාරය කරමින් අපේ රට පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් නිර්මාණය කළා. අපේ මේ උත්සාහයන්ගේ ප්‍රතිඵල දැනටමත් දැකිය හැකියි. ඉතා මෑත දී මා බ්‍රසල්ස් නුවරට ගිය අස්ථාවේ යුරෝපා කොමිසමේ ඉහළ නිලධාරීන් 2017 ජනවාරියේ සිට ජීඑස්පී ප්ලස් සහනය නැවතත් ශ්‍රී ලංකාවට ලබාදෙන බවට විශ්වාසයෙන් සහතික වුණා. ජපන් - ශ්‍රී ලංකා පරිපූර්ණ සහයෝගීතාව සම්බන්ධීකරණය සඳහා ජපන් අගමැතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබෙනවා.

අපේ අපනයන සඳහා නව වෙළඳපොලවල් නිර්මාණය කර ගැනීමේ අරමුණින් තවත් වෙළෙඳ ගිවිසුම් 3 ක් පිළිබඳව අප සාකච්ඡා කරමින් සිටිනවා. ඉන්දියාව සමග එට්කා ගිවිසුම, චීනය හා සිංගප්පූරුව සමග ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම්.

මේ විශාල ආර්ථික කලාපයන් ඔවුනොවුන්ගේ දේශීය වෙළඳපොල ආධිපත්‍යය පවත්වාගෙන යාමට වෙහෙසෙනවා. ඒ වෙලඳපොලවල් අතීතයේ අපේ සාම්ප්‍රදායික ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව තිබුණු බවත් අප අමතක කළ යුතු නෑ.

අප බොහෝ දෙනෙක් සිතුවේ හම්බන්තොට වරායට සහ මත්තල ගුවන් තොටුපොළට ලබාගත් අති විශාල ණය ප්‍රමාණය අපේ ඉදිරි පරම්පරාවලට ගෙවන්නට සිදුවනු ඇතැයි කියායි. මේ ණය ගත්ත අයත් සැලසුම් කරලා තිබුණේ එහෙමයි. ඒත් අපි මේ තත්වය වෙනස් කරන්න මහන්සි වුණා. මේ ණය හිලව් කිරීමට හිමිකාරීත්වයේ කොටස් ලබාදෙන ක්‍රමවේදයක් හම්බන්තොට වරායට සහ මත්තල ගුවන් තොටුපොළ වෙනුවෙන් අප සකස් කළා. ඒ දෙකම රාජ්‍ය - පුද්ගලික හවුල් ව්‍යාපාර සේ පවත්වාගෙන යාමට ඒ ඔස්සේ අවකාශ ලැබෙනවා. චීන සමාගම් මේ ක්‍රමවේදය යටතේ වරාය සහ ගුවන්තොටුපොල සංවර්ධනය කරන්නට ඇඩි උනන්දුවක් දක්වනවා.

වරාය හා ගුවන් තොටුපොළ වෙනුවෙන් ගෙවන්නට ඇති ඉතිරි ණය පියවන්නට අපට ශක්තිය තියෙනවා. ඒ නිසා හම්බන්තොට වරායේ සහ ගුවන් තොටුපලේ ණය අපේ දරුවන් පිට පැටවෙන්නේ නැති බවට සහතික විය හැකියි. ඒ වගේම හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් සහ නාවුක සේවා කේන්ද්‍රයක් බවට පත් වීමේ වාසිය ද අපට ඉතිරි වෙනවා.

චීනය, කොරියාව හා ජපානය යන රටවල ආයෝජකයෝ මේ ආර්ථික ප්‍රවර්ධන කලාපයේ මෙන්ම දිවයිනේ වෙනත් ස්ථානවලත් කර්මාන්ත ඇරඹීමට කැමැත්ත පළ කර තිබෙනවා. ඔවුන් මේ කර්මාන්ත කලාපවල නිපදවන නිෂ්පාදන යුරෝපයට, චීනයට, ජපානයට, එක්සත් ජනපදයට මෙන්ම ඉන්දියානු සාගරය වටා තිබෙන බොහෝ රටවලට මෙහි සිට අපනයනය කරන්නට හැකි වෙනවා. මැද පෙරදිග සිට ඉරානය, ඇෆ්ගනිස්ථානය, පාකිස්තානය, ඉන්දියාව, බංග්ලාදේශය, මියන්මාරය, තායිලන්තය, මැලේසියාව, සිංගප්පූරුව හා ඉන්දුනීසියාව දක්වා රටවල් තුළ බිලියන 2 කට වැඩි ජන සංඛ්‍යාවක් දැනට සිටිනවා. 2050 වන විට ඒ සංඛ්‍යාව බිලියන 3 ක් දක්වා වැඩි වෙනවා.

අපේ සංවර්ධන උපාය වන්නේ ඉන්දියානු සාගරයේ මේ දැවැන්ත වෙළෙඳපොළ සමග ගනුදෙනු කිරීමයි. මේ සඳහා ඉහත කී රටවල ආණ්ඩු සමග වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම අපගේ බලාපොරොත්තුවයි.

මේ අතරම අනාගතයේ පොදු සහ පුද්ගලික අංශයන්හි සංවර්ධන වෑයම සඳහා පදනම සකසන ප්‍රධාන සංවර්ධන කවුලු දෙකක් අපේ රට තුළ නිර්මාණය කිරීමට දැන් මූලිකත්වය ගෙන තියෙනවා. ගෝලීය අගය දාමයන් සමග වේගවත් හා ආරක්ෂිත සම්බන්ධකම් ඇති කර ගත හැකි සාධනීය ව්‍යවසායන්ට අවශ්‍ය සංවිධානාත්මක සහ යටිතල පහසුකම් සම්බන්ධීකරණය මෙම කවුළු හරහා සිදු කෙරෙනවා. මෙවන් ක්‍රියාදාමයකට ශ්‍රී ලංකාව මුල පුරන්නේ පළමු වතාවටයි.

මෙම සංර්ධන කවුලු දෙක දිවයිනේ මෝසම් සුළං වැසි දෙකෙන් පෝෂණය ලබන ප්‍රදේශ දෙකට සම්බන්ධ වනවා. නිරිත දිග කවුලුව කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය හා දක්ෂිණ අධිවේගී මාර්ගය කේන්ද්‍ර කොට ගෙනයි නිර්මාණය වෙන්නේ. ගෝලීය අගය දාමයන්ට අදාළ ලොකුම විභවය ඇත්තේ මේ කලාපයේයි. එයට හේතුව කටුනායක ගුවන් තොටුපොළ සහ කොළඹ වරාය පිහිටා තිබීමයි.

අපේ අරමුණ වන්නේ,

- මෙගාපොලිස් සංවර්ධන අධිකාරියක් පිහිටුවා මිලියන 8.5 ක ජනකායකට ජීවත් විය හැකි බස්නාහිර මහා නගර කලාපයක් ඇති කිරීම,
- චීන සමාගමක් විසින් කොළඹ වරායට යාබදව මුහුද ගොඩ කර නිර්මාණය කරන බිම් ප්‍රදේශයේ නව මූල්‍ය නගර කේන්ද්‍රයක් ඇති කිරීම,
- නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක, කොළඹ – මහනුවර අධිවේගී මාර්ගයට හා මත්තල හරහා දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කිරීමෙන් මධ්‍යම කඳුකරය පුරා පැතිරෙන අනු ආර්ථික කවුළුවක් නිර්මාණය කිරීම. මේ කවුළුව තුළ වැවිලි සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම, තේ වගාව නගා සිටුවීම, කෘෂිකර්ම නවීකරණය, සංචාරක සහ සේවා අංශයන්ට ප්‍රමුඛත්වය ලබා දීම.

දෙවැනි සංවර්ධන කවුලුව ඊසාන දිග සංවර්ධන කවුලුවයි. එය ත්‍රිකුණාමලය වරාය හා රජරට යා කරමින්, මඩකලපුව සහ යාපනය සම්බන්ධ කරනවා. මොරගහකන්ද සහ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘති තනා නිම කිරීම සමග මේ ප්‍රදේශයට නව යුගයක් උදා වනවා. ගොවිතැන් සඳහා වැඩිපුර ඉඩම් යෙදවිය හැකි වනවා. එසේම අපේ පෞරාණික පොළොන්නරුව සහ අනුරාධපුර දෙනුවර නවීන නාගරික ප්‍රදේශ ලෙස සීරුවෙන් දියුණු කිරීමේ පදනම මේ සමග සැකසෙනවා. ත්‍රිකුණාමලය ලෝක ප්‍රමිතියට පත් වූ වරාය නගරයක් ලෙස දියුණු කරනවා.

මුලතිව් හා කිලිනොච්චි ප්‍රදේශවල නව නිවාස සහ වෙනත් යටිතල පහසුකම් නැවත ඉදිකිරීමට ඉහළම ප්‍රමුඛස්ථානය අපි ලබා දෙනවා.

<u>තිරසාර සංවර්ධනය</u>

ආර්ථික උත්තේජනය හා පුද්ගල ආදායම් ඉහළ නැංවීම සඳහා අපි ප්‍රමුඛතාවය ලබා දෙනවා. ඒ සමගම හැම පුරවැසියෙකුටම නිවාසයක් හිමි කර ගැනීම ඇතුළුව, සමාන අවස්ථා හිමි වන, අයිතිවාසිකම් ආරක්ෂා වන සමාජයක් ස්ථාපිත කිරීමට ද අප සැලසුම් කරනවා. ග්‍රාමීය නිවාස ණය වැඩසටහන, නාගරික පුනර්ජීව නිවාස වැඩසටහන, වතු නිවාස වැඩසටහන සහ නැවත පදිංචි කරවීමේ වැඩසටහන ආදිය හරහා විශාල ජන සංඛ්‍යාවකට නිවාස හිමි කර ගැනීමට අවස්ථාව ලැබෙනවා. අපේ සැලැස්ම වන්නේ නගර සහ ඒ ආසන්නයේ සිටින

මධ්‍යම පාන්තිකයන්ට නිවාස ලක්ෂ 5 ක් ඉදිකිරීමට සහ නගරවල සිටින අඩු ආදායම් ලාභීන්ට නිවාස 65,000 ක් ඉදිකිරීමට ඉඩ සැලසීමයි. එයට සමාන්තරව ගැටුම් පැවති ප්‍රදේශයන්හි අවතැන්වූවන්ට නිවාස ඒකක 65,000 ක් ද ඉදි කරනවා. වතුකරයේ නිවාස අවශ්‍යතාවයන්ගෙන් 65% ක් 2020 වන විට සපුරාලීම අපේ ඉලක්කයයි.

2015 සැප්තැම්බරයේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සම්මත කර ගත් තිරසාර සංවර්ධන ඉලක්කවලට අපේ රජය මුළුමනින්ම කැප වී සිටින බවට මෙහිදී මා අවධාරණය කරන්නට කැමතියි. අපේ ආර්ථිකයේ කර්මාන්ත, සේවා සහ කෘෂි කර්මාන්තය දියුණු කරන්නේ මේ මූල ධර්මවලට අනුකූලවයි. උදාහරණයක් හැටියට ආර්ථික ප්‍රවර්ධන කලාපයන් ලෙස දකුණේ අක්කර 15,000 ක් දියුණු කරන විට භාවිතයට නොගන්නා ඉඩම්වල වන වගාව කිරීමට අප කටයුතු කරනවා. එසේම අපේ ප්‍රධාන නගරවල කැලි කැසල ඉවතලීමේ දැවැන්ත අභියෝගයට තිරසාර විසඳුම් දීමට කටයුතු කරනවා. දහස් ගණනක් ජීවිත වලට හිරිහැරයක් වූ මේ බරපතළ ප්‍රශ්නයට පසුගිය රජයෙන් කිසිඳු පිළියමක් යොදා තිබුණේ නැහැ.

දිවයිනේ දැනට ආරක්ෂිත පානීය ජලය නොමැතිව වෙසෙන සියලුම ප්‍රජාවන්ට එම පහසුකම ලබාදීමට අප සැලසුම් කරනවා. එසේම බැහැරලන ජලය යළි පිරිසිදු කරලීමේ වැඩ සටහන් සඳහා අපි පූර්ණ සහය ලබා දෙනවා. අපේ ස්වභාවික දායාදයන් හා සුන්දරත්වය ගැන ඉතිහාසය මුළුල්ලේ මෙරටට ආ විදේශිකයන් මහත් ප්‍රශංසනාත්මකව සඳහන් කළ බව අප දන්නවා. අප සියළු සංවර්ධන කාර්යයන් කරන්නේ ස්වාභාවික උරුමයන් සියල්ලම ආරක්ෂා කර ගනිමින්. අපේ ජාතික රජය මගින් අප ගොඩනගන්නේ සැමට අස්වැන්න ලැබෙන ආර්ථිකයක්. සැමට සංවර්ධන ප්‍රතිලාභ ලැබීම ප්‍රවර්ධනය කරන ආර්ථිකයක්. සැමට මිතුරු ආර්ථිකයක්. සැමට වාසිදායක ආර්ථිකයක්. තිරසර සංවර්ධනයට මං සලසන ආර්ථිකයක්.

අප බලාපොරොත්තු වන්නේ තිරසර සංවර්ධනයට පදනම සකසන නීතිගරුක ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීමයි. මේ සඳහා අවශ්‍ය රාමුව සහ ක්‍රමවේදයන් සැපයීමට තිරසාර සංවර්ධන සභාවක් ළඟදීම පිහිටුවනවා. තුන්වන පරම්පරාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ ලෙස මා මෙය හඳුන්වන්නට කැමතියි. පළමු පරම්පරාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වූයේ ජනාධිපති ජයවර්ධන මැතිතුමා විසින් අරඹන ලද වෙළෙඳපොළ, ආර්ථික ක්‍රමයයි. දෙවැනි පරම්පරාවේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළේ ජනාධිපති ප්‍රේමදාස මැතිතුමායි. තෙවැනි පරම්පරාවේ ප්‍රතිසංස්කරණ සඳහා අප පදනම් කර ගන්නේ බහු ප්‍රවේශ ආර්ථික සම්බන්ධතා හරහා ගෝලීය අගය දාමයන් වෙත සම්බන්ධතා ඇති කර ගැනීම සහ වෙළඳ වර්ධනය ඉහළ නංවා ගැනීමයි. සුදුසුකම් ඇති පුද්ගලයන් බලාපොරොත්තු වන්නේ වෘත්තීයමය හැකියාවන් අනුව ඉහළ වැටුප් ලැබෙන රැකියාවනුයි. ඒ නිසා අඩු වැටුප් නිෂ්පාදන පදනම් කරගත් ආර්ථිකයක අපට තව දුරටත් රැඳී සිටින්නට බැහැ.

අප සිදු කරන මේ ප්‍රතිසංස්කරණ නිසා රැකියා දස ලක්ෂයක ඉලක්කය සපුරා ගන්න පුළුවන්. ඒ නිසා මධ්‍යම පන්තිය පුළුල් වෙනවා. ගොවීන් සමෘද්ධිමත් වෙනවා. සැම දරුවෙකුටම අධ්‍යාපන අවස්ථා හිමි වෙනවා. අපේ අවසාන ඉලක්කය රටේ හැම පුරවැසියෙකුටම ඉසුරුබර හෙට දවසක් බිහි කිරීමයි. හැම පුරවැසියෙක්ම පොහොසත් ජාතියක ප්‍රතිලාභ විඳිනු දැක්ම අපේ අපේක්ෂාවයි. එසේම සියලු මූලික අයිතිවාසිකම් භුක්ති විඳින සමාජයක් බිහිකිරීමයි. මෙහිදී කාන්තාවන්ගේ පූර්ණ සහභාගීත්වය ලබාගැනීමට අප ක්‍රියා කරනවා. එමෙන්ම විශේෂ අවශ්‍යතා ඇති පුරවැසියන්ට සමාජයේම කොටස්කරුවන් ලෙස සිය ජීවන ඉලක්ක සාමාන්‍ය පරිදි සපුරා ගත හැකි පරිසරයක් අප සකසනවා.

ව්‍යාපාරික අංශයේ ප්‍රමුඛතා

ගෝලීය අගය දාමයට තවදුරටත් සම්බන්ධ විය හැකි ආර්ථික ක්ෂේත්‍රයන් ගණනාවක් අපේ රටේ තිබෙනවා. ඩිජිටල් ආර්ථිකය, සංචාරක කර්මාන්තය හා වාණිජ කෘෂිකර්මාන්තය දැන් වර්ධනය කළ යුත්තේ මේ ක්ෂේත්‍ර හරහා වැඩි වැටුප් ලබන රැකියා අවස්ථා තරුණ තරුණියන්ට උදා කර ගත හැකි බැවිනුයි. රාජ්‍ය අංශයට වැඩි බරක් නොතබමින්, නිපුණ පුද්ගලයන් හා ව්‍යවසායන් වැඩි වැඩියෙන් සම්බන්ධ කර ගනිමින්, සිදු කෙරෙන අපේ ආර්ථික කුළු ගැන්වීම් ඔස්සේ පෙර කී ක්ෂේත්‍ර තුන - ඩිජිටල් ආර්ථිකය, සංචාරක කර්මාන්තය හා වාණිජ කෘෂිකර්මාන්තය -  වඩ වඩාත් පුළුල් කෙරෙනවා.

ඩිජිටල් ආර්ථිකය

ලංකාවේ ඕනෑම තැනක වෙසෙන සියලු පුරවැසියන්ට දැරිය හැකි මට්ටමක ආරක්ෂිත අන්තර්ජාල පහසුකම් ලබාදීමට අපි පියවර ගන්නවා. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ දේශ සීමා බාධක ඉවත් කරනවා. එවිට මුදල් නෝට්ටු හුවමාරු නොවන විද්‍යුත් ගනුදෙනු අපි දිරිමත් කරනවා. ඩිජිටල් තාක්ෂණය පිළිබඳ නව විෂය නිර්දේශයක් පාසල් සිසුන්ට හඳුන්වා දෙනවා. විද්‍යුත් වාණිජ ව්‍යවසායකයන්ට අත දෙන අතරම, සයිබර් ආරක්ෂණ සුපරීක්ෂණය හා ප්‍රතික්‍රියා පිළිබඳ පුහුණුව ද ලබා දෙනවා.

රජයට හිමි ව්‍යාපාර ප්‍රතිසංස්කරණය

පොදු වාණිජ ව්‍යවසාය මණ්ඩලයක් නීතියෙන් පිහිටුවීමට අප කටයුතු කරනවා. ඒ හරහා රාජ්‍ය හිමිකාරීත්වය සහිත සියලු ව්‍යාපාර ආයතන වාණිජ මට්ටමින් වඩාත් කාර්යක්ෂමව පාලනය කරනවා. රජයට හිමි ව්‍යාපාරවල කොටස් මහජන ධන භාරය හරහා රටේ මහජනතාව වෙනුවෙන් ආයෝජනය කරනවා.

මූල්‍යමය අන්තර්ග්‍රහණය (ජ්ඍදචදජඝචත ධිදජතහළඝධද)

2016 වසර මුල දී ක්ෂුද්‍ර මූල්‍ය නීති පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසු ග්‍රාමීය ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු සඳහා නීතිමය රාමුවක් ලැබී තිබෙනවා. රටේ ග්‍රාමීය ජනතාවට වැඩිපුර ණය පහසුකම් ලබාදීමේ අරමුණින් විදේශීය ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රභවයන් සමග සම්බන්ධතා පිහිටුවා ගන්නවා. කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවලට ණය ලබාදීම සඳහා දැනටමත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය රුපියල් බිලියන 5 ක ප්‍රතිපාදනයක් වෙන් කොට තිබෙනවා. මහ බැංකුව විසින් ජාතික මූල්‍යමය අන්තර්ග්‍රහණයක් පිළිබඳ ප්‍රතිපත්තියක් සම්පාදනය කරමින් සිටිනවා. ග්‍රාමීය සංවර්ධන බැංකු වඩාත් සවිමත් කිරීම අපේ එක අරමුණක්. කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ට සහන කොන්දේසි මත ණය ලබා ගැනීමට ග්‍රාමීය සංවර්ධන බැංකුවලින් විශාල අනුග්‍රහයක් ලැබෙනවා. මහ බැංකුවේ මෑත දී පිහිටුවන ලද ප්‍රාදේශීය දෙපාර්තමේන්තු හරහා මේ ග්‍රාමීය සංවර්ධන බැංකුවලට වැඩි අධීක්ෂණයක් ලැබෙනවා. අපට ඕනෑ වී ඇත්තේ බැංකු සමග ගනුදෙනු කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කරන අතර නව ව්‍යාපාරික අවස්ථා සඳහා දිරිගැන්වීමයි.

සංචාරක

අපේ අරමුණ ඉහළ අගයක් සහිත ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමයි. සංස්කෘතික උරුමයන්, වන ජීවීන්, සහ පරිසරය පදනම් කර ගනිමින් සියළු පළාත් සංචාරක පාරාදීසයන් බවට පත් කිරීමේ සැලසුම් සකසා තියෙනවා. ලෝක සංචාරකයන්ගේ කදිම සංචාරක අත්දැකීමක් බවට ශ්‍රී ලංකාව පත් කරනවා.

කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය නවීකරණය කිරීම

කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය දැවැන්ත ක්ෂේත්‍රයන් දෙකක්. මේවා නවීකරණය කිරීමට අඩු තරමින් දශකයක කාලයක් ගත වෙනවා. ග්‍රාමීය නවීකරණ මණ්ඩලයක් පිහිටුවීමට අප අදහස් කරනවා. ප්‍රථමයෙන් ධීවර හා කුකුල් පාලන කර්මාන්තයන් දියුණු කිරීමෙන් අපනයන වෙළෙඳපොළක් ද දිනා ගැනීමට අප අදහස් කරනවා.

තේ සහ රබර් කර්මාන්ත දැනට මුහුණ දී තිබෙන අභියෝග හා ගැටලු අප සමීපව අධ්‍යයනය කරනවා. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහකරණය කිරීමෙන් නව ප්‍රාග්ධනය හඳුන්වා දෙන්නටත්, ඵලදායීතාව වැඩි කරන්නටත් අප ක්‍රියා කරනවා.

ජාතික කෘෂිකර්ම අලෙවිකරණ අධිකාරිය

නිෂ්පාදකයාත්, පාරිභෝගිකයාත් අතර ඉතාම වැදගත් හා තීරණාත්මක පුරුක වන්නේ අලෙවිකරණයයි. කෘෂි නිෂ්පාදන අලෙවිකරණය සඳහා ජාතික කෘෂිකර්ම අලෙවිකරණ අධිකාරියක් පිහිටුවනවා. කෘෂි නිෂ්පාදනයන් නෙලා ගැනීමෙන් පසු සිදුවන හානිය අවම කිරීමට පළාත් මට්ටමින් ශීතාගාර පහසුකම් හා වෙනත් යටිතල පහසුකම් වැඩි දියුණු කරනවා. සහතික කළ මිලක් ගොවීන්ට ලබාදීමට නම් අස්වනු නෙළන කාලයට ඇති තරම් ගබඩා පහසුකම් පැවතිය යුතුයි. මේ වගකීමත් අලුතෙන් පිහිටුවන අධිකාරියට පැවරෙනවා. එසේම ගොවීන්ට ඍජුවම තමන්ගේ ඵලදාව ගෙනැවිත් අලෙවි කිරීමට හැකි වන පරිදි දීපව්‍යාප්තව සති පොළවල් 250 ක් ඇති කරනවා.

මානව සම්පත් වැඩි දියුණු කිරීම

දැනුම ආර්ථිකයේ හා නූතන ලෝකයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි අපේ අධ්‍යාපන ක්‍රමය, විශේෂයෙන්ම උසස් අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම අවශ්‍ය වී තිබෙනවා. හුදෙක් විභාග සමත් වනවා වෙනුවට රැකියාවලට අවශ්‍ය නිසි කුසලතාවලින් පරිපූර්ණ වූ උපාධිධාරීන් බිහි කිරීමේ හදිසි අවශ්‍යතාවයට අප මුහුණ දෙනවා.

ආර්ථිකය සහ පාලනයේ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම

2020 වන විට අපේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය 40% දක්වා ඉහළ නැංවීමට ගත හැකි සියලුම පියවර අප අනුගමනය කරනවා. එසේම කාන්තාවන් විසින් මෙහෙය වනු ලබන කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර මගින් අපේ මධ්‍යම පාන්තිකයන්ට අවශ්‍ය කරන විවිධ භාණ්ඩ හා සේවා සැපයීමට හැකි වනවා. මේ අතර පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගෙන් 25% ක් කාන්තා නියෝජිතයන් විය යුතු බවට දැන් නීතිමය අවශ්‍යතාවයක් තිබෙනවා. අපේ ඉදිරි දැක්ම වන්නේ කාන්තාවන්ගේ ආර්ථික මෙන්ම දේශපාලන සහභාගීත්වය ගුණාත්මකවත් වැඩි කර ගැනීමයි.

ක්‍රීඩා හා විනෝදාස්වාදය සඳහා යටිතල පහසුකම්

දිවයින පුරා මහජන උද්‍යාන පිහිටුවීමට කටයුතු කරන අතරම හැම පළාතකම ක්‍රීඩා හා ශරීර සුවතාවය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීමට අප පියවර ගන්නවා. ඔලිම්පික් ප්‍රමිතියට අනුකූල පිහිණුම් තටාක මෙන්ම මලල ක්‍රීඩා ධාවන පථ ඇති කිරීම සැලසුම් කර තිබෙනවා.

අධ්‍යාපනය

13 වසරක අනිවාර්ය අධ්‍යාපනය

වසර 13 ක් පාසල් අධ්‍යාපනය ලැබීම රටේ සියලු දරුවන්ට අනිවාර්ය කෙරෙන නව ප්‍රතිපත්තියක් අප හඳුන්වා දී තිබෙනවා. ලබන වසරේ මෙහි නියමු ව්‍යාපෘතිය අප ආරම්භ කරනවා. සාමාන්‍ය පෙළෙන් පසු ඉහළ අධ්‍යාපනය සඳහා යොමු නොවන සිසු සිසුවියන් වෙනුවෙන් උසස් ද්විතීක වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දෙනවා. වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනය සඳහා අවශ්‍ය අමතර ගුරුවරුන් හා උපදේශකයන් බඳවා ගන්නවා. අපේ ඉලක්කය 2019 වන විට දිවයිනේ සියළු ගුරු පුරප්පාඩු පිරවීමයි. සියළුම පාසැල්වලට අනුමත ගුරුවරු සංඛ්‍යාව ඒ වන විට ලබා දෙනවා. සෑම පාසැලකටම නියමිත ගුරුවරු සංඛ්‍යාව වෙන වෙනම සැපයීමට අවශ්‍ය නීති රීති සම්පාදනය කරනවා.

ඉගැන්වීමේ ඉහළ ප්‍රමිතිය පවත්වාගෙන යෑම සඳහා පාඨශාලා පරීක්ෂක ක්‍රමය යළිත් හඳුන්වා දෙනවා. පාසැල් වල ගුණාත්මක තත්වය ආරක්ෂා කරලීම සඳහා දෙමාපියන්, ගුරුවර ගුරුවරියන්, ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සමන්විත පාසැල් මණ්ඩල පත් කරනවා.

එසේම උසස් පෙළ සෑම සිසු සිසුවියකටම ටැබ්ලට් පරිගණකය බැගින් ලබා දීමේ නියමු ව්‍යාපෘතිය අප ආරම්භ කරනවා.

පාසැල් සඳහා සිසුන් ඇතුළත් කර ගන්නා ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් පාසල් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙනවා.

<u>පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීම</u>

මුල් ළමාවිය සංවර්ධනය ඉලක්ක කරගත් පස් අවුරුදු වැඩසටහනක් අප දියත් කොට තිබෙනවා. මේ හරහා පෙර පාසල් අධ්‍යාපනය දියුණු කරන අතරම සෞඛ්‍ය, පෝෂණය, මානසික සෞඛ්‍ය අවශ්‍යතා සහ ළමා රැකවරණය වැනි සියලුම අංශ වෙත නිසි අවධානය යොමු කරනවා.

<u>රැකී රක්ෂා</u>

රැකියා අවස්ථා සහ ඒවාට සරිලන කුසලතා අතර නොගැලපීමක් අද අපට දකින්නට තියෙනවා. මේ නිසා රැකියා අවස්ථා ලද නොහැකිව ලතවන විශාල තරුණ තරුණියන් සංඛ්‍යාවක් රටේ සිටිනවා. ඒ අතර පුරප්පාඩු පුරවාගත නොහැකිව සිටින ආයතන හා ව්‍යාපාර රාශියක් ද තිබෙනවා. ඒ නිසා රැකියාවන්ට අවශ්‍ය කුසලතාවන් තරුණ තරුණියන් වෙත ලබා දීම සඳහා අතිරේක පුහුණු අවස්ථා අප උදා කරනවා.

මේ පුහුණු කටයුතු සඳහා රජයේ සහ පුද්ගලික අංශයේ සේවාවන් එක්තැන් කර, රජයට සම්බන්ධ පුහුණු ජාලය යොදවා ගැනීමට බලාපොරොත්තු වෙනවා. කඩිනම් පුහුණු සහ රැකියා වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන්නේ රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් ලෙසින්. පුද්ගලික අංශයේ පුහුණුවට අවශ්‍ය මුදල් සහ පුහුණුවන්නන්ගේ දීමනා රජය විසින් දරනවා. මෙම ව්‍යාපෘතිය 2017 වසරේ ආරම්භ කර 2018 වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා.

<u>නිවාස</u>

මධ්‍යම පන්තිය සහ වැඩකරන ජනතාව වෙනුවෙන් නිවාස ලක්ෂ 5 ක් ඉදි කිරීමට අප ක්‍රියා කරනවා. සහන මිළකට මේ නිවාස අයිතිය ඔවුන්ට අප ලබා දෙනවා. මේ නිවාස අප ඉදි කරන්නේ පුද්ගලික අංශයේ මූලිකත්වය ඇතිව රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාර ලෙසයි. මේ නිවාස යෝජනා ක්‍රම නව නගර කේන්ද්‍ර කොට ගෙන නිර්මාණය කෙරෙන්නේ තිරසර

නාගරීකරණය පදනම් කරගෙනයි. එමගින් රජයේ සමාජ ආර්ථික පරමාර්ථයන්ට මෙන්ම තිරසාර සංවර්ධන ඉලක්කයන්ට ද ශක්තිය සැපයෙනවා. අයවැය යෝජනා ඔස්සේ මේ වැඩපිළිවෙළ පිළිබඳ සවිස්තර තොරතුරු ඉදිරිපත් කරනවා.

අද අපේ ආර්ථිකයට අවශ්‍යව ඇත්තේ පාලනයක් නොව නියාමනයක්. ඉසුර පිරුණු රටක් බවට පත් වීමේ අපේක්ෂාව යථාර්තයක් බවට පත් කර ගත හැක්කේ ආර්ථිකය වඩාත් නිදහස් කරලීමෙන්. 1978 දී හඳුන්වා දුන් පළමු පරම්පරාවේ දූරදර්ශී විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා සංවෘත ආර්ථිකයෙන් අපේ රටට සිදු වූ පසුබෑම වළක්වා ගැනීමට හැකි වුණා. දැන් තුන්වෙනි පරම්පරාවේ ප්‍රතිසංස්කරණ කරා රැගෙන යාමේ දැවැන්ත අභියෝගය අප හමුවේ තිබෙනවා. ශ්‍රී ලංකාව ආසියාවේ නවීන, ආර්ථික සාර්ථකත්වයේ සංකේතය බවට පත් කළ හැක්කේ එම අභියෝගයට එක්සත්ව, එක්සිත්ව මුහුණ දීමෙනුයි.

මේ ආර්ථික ප්‍රතිසංස්කරණ සැලැස්ම පිළිබඳ වැඩි විස්තර ඇතුළත් පොත් පිංචක් අපි ළඟදීම නිකුත් කරනවා.

ගරු කතානායකතුමෙනි,

ශ්‍රී ලංකාවට ආර්ථික වශයෙන් නැගී සිටින්නට ලැබුණු අවස්ථා ගණනාවක්ම විවිධ හේතු සාධක නිසා අවාසනාවන්ත ලෙස අපට මග හැරී ගියා. නැවතත් එසේ වන්නට ඉඩ දෙන්නට බැහැ. ඒ නිසා වත්මන් ගෝලීය ගතිකයන් හා ශ්‍රී ලංකාව සතු ශක්තීන් හා අවස්ථා අප අවබෝධ කර ගත යුතුයි. ඒ සියල්ලෙන් ප්‍රයෝජන ගත යුතුයි.

අප සියළු දෙනාටම විවිධ පුද්ගලික මතවාද තියෙනවා. දේශපාලන අරමුණු තියෙනවා. නමුත් ඒ සියල්ලට ඉහළින්, අපේ රට ගැන සිතන්නය කියා මා ඔබට යෝජනා කරනවා. ජාතික ආණ්ඩු පදනම මත රට ඉදිරියට රැගෙන යාමේ අවකාශයෙන් අපි උපරිම ප්‍රයෝජන ගත යුත්තේ ඒ නිසයි.

අතීතයට චෝදනා කිරීමෙන් පමණක් අනාගතය සරු කර ගන්නට බැහැ. දුර්වල හා වැරදි සහගත ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම නිසා අපේ රට මත පැටවී ඇති ණය බර ගැන සුසුම් හෙලූ පමණින් අනාගතය ගොඩ නැංවෙන්නේ නෑ. ඒ සඳහා නිවැරදි සැලසුම් සකස් කර ගත යුතුයි. උපාය මාර්ග නිර්මාණය කර ගත යුතුයි. වෙහෙසිය යුතුයි. කැපවිය යුතුයි.

නව ලෝකයේ නව ප්‍රවණතාවන් අධ්‍යයනය කොට, ඒ සමග එකට එක තරග කළ හැකි ශක්තිමත් ආර්ථික පදනමක් අප ගොඩනංවා ගත යුතුයි.

අපේ රටේ පමණක් නොව, ඊළඟ පරපුරේ ද අනාගත ජීවය රඳා පවතින්නේ මේ පදනම මතයි. ඒ නිසා අප කෙසේ හෝ මේ ආර්ථික අභියෝගය ජය ගත යුතුයි. මේ ගමන් මග ඉදිරියටම යා යුතුයි.

තිරසාර වර්ධනය සහ සාර්ථකත්වය සඳහා කැප වුණු දේශයක වෙසෙන ශ්‍රී ලංකා මාතාවගේ දරුවන් දිනෙන් දින දියුණු වන සමාජයක සෙවන ලබන, බලවත් ආර්ථික ශක්තියකින් යුතු පුද්ගලයන් බවට පත් කළ හැක්කේ ඒ මාර්ගයේ ගමන් කිරීමෙනුයි.